## දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
## DEVI BALIKA VIDYALAYA - COLOMBO

මනසා සංවුතා ධීරා
MANASA SANVUTHA DHEERA

### තෙවන වාර පරීක්ෂණය - 2011

**07 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව - I** කාලය: පැ. 02 යි

---

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

* ළමා නාට්‍ය කලාව සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් නිවැරදි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් ( ✗ ) ලකුණ ද යොදන්න.

1. ළමා නාට්‍යයක තේමාව සරල විය යුතුය. ( )

2. ළමයින් සඳහා නාට්‍ය නිර්මාණයේදී රංගනය කළ යුත්තේ ළමයින් පමණයි. ( )

3. ළමා නාට්‍යවල චරිත සංකීර්ණ විය යුතු නොවේ. ( )

4. චරිත බහුල වශයෙන් යොද ගැනීම ළමා නාට්‍යවලදී සිදු නොවේ. ( )

5. නාට්‍ය අවසානයේදී ළමයා යම්කිසි මානසික කම්පනයට පත් කිරීම ළමා නාට්‍ය වලින් සිදුවේ. ( )

(ලකුණු 05)

* නිවැරදි පිළිතුරු සපයන්න.

6. වේදිකා නාට්‍ය කලාවේ සුවිශේෂී ලක්ෂණයක් නොවන්නේ,
   i. සජීවී බවය.    ii. සාමූහික බවය.
   iii. රූප පටිගත කිරීමයි.    iv. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීමය.

7. අනුශාංගික කලාවන්ට අයත් නොවන්නේ මින්,
   i. ආලෝකය.    ii. ශබ්ද
   iii. වර්ණ.    iv. චරිත

8. සාර්ථක රංගනයක් ඉදිරිපත් කිරීමට අදාළ නොවේ.
   i. අද්දැකීම්    ii. සබකෝලය.    iii. පරිකල්පනය.    iv. අවබෝධය

9. යම් නාට්‍යයකදී නළු නිළියන් විවිධ චරිත සඳහා අඳින ඇඳුම් මෙනමින් හඳින්වේ.
   i. රංගාභරණ.    ii. රංගභාණ්ඩ
   iii. වේෂභූෂණ.    iv. රංග වස්ත්‍ර

10. නාට්‍යයකදී වේදිකාවේ පසුබිමින් මහා අකුණු හඬක් ඇසීම අයත් අභිනය වන්නේ
i. ආහාර්ය අභිනය. ii. වාචික අභිනය.
iii. සාත්වික අභිනය.. iv. ආංගික අභිනය.

(ලකුණු 5)

* පහත රංග භාණ්ඩවලට ගැලපෙන චරිත තෝරන්න.

| | |
|---|---|
| 11. පොරව | 1. ගොපල්ලා |
| 12. කඩුව | 2. ලියන්නා |
| 13. හෙල්ල | 3. රජතුමා |
| 14. ඔරලෝසුව | 4. දර කපන්නා |
| 15. කෙවිට | 5. දෙරටු පාලකයා |

(ලකුණු 5)

* පහත ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

16. වචනයෙන් තොරව කරනු ලබන රංගනය ..................................... නම් වේ.

17. නාට්‍ය කලාවේ ප්‍රධාන මාධ්‍ය ............................................................ නම් වේ.

18. පිටපතක් හෝ පුහුණුවකින් තොරව කරනු ලබන රංගනය ............................................... ලෙස හැඳින්වේ.

19. වර්ණ, රේඛා, හැඩතල, මාධ්‍ය කොටගත් විෂයය වන්නේ ...................................................... යි

20. ජන ක්‍රීඩා තුළින් අපේක්ෂිත අරමුණක් ලෙස .................................. අගය කළ හැකිය.

(අභිනය, සිනමාව, සාමූහික බව, සබකෝලය, කප්පණික නිරූපණය, අභිරූපණය, චිත්‍ර කලාව)

(ලකුණු 5)

## II කොටස

* පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත කතා පුවත් ඇසුරෙන් කැමැති කතා පුවතක් තෝරාගෙන ගැළපෙන නාට්‍යෝචිත සිද්ධි ඇසුරෙන් සුදුසු කෙටි නාට්‍ය පිටපතක් සකස් කරන්න.
   - දුටුගැමුණු කුමාරයාගේ කතාන්දර
   - බුද්ධදාස රජතුමාගේ කතාන්දරය
   - අන්දරේගේ කතාන්දර

   (ලකුණු 10)

2. i. වෙස්මුහුණ නිර්මාණ සඳහා යොදා ගනු ලබන ස්වභාවික හා අපතේ යන ද්‍රව්‍ය ලේඛනයක් සකස් කරන්න. (ලකුණු 05)

   ii. වෙස්මුහුණු පැළඳ රංගනයේ යෙදීමේ වාසි 5 ක් කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

03. i. නළුවෙකුට හඬ අභ්‍යාස පුහුණු කිරීමෙන් අත්වන වාසි 5 ක් ලියන්න. (ලකුණු 05)

    ii. ඔබ දන්නා හඬ අභ්‍යාසයක් ලියන්න. (ලකුණු 05)

4. i. අනුශාංගික කලාවන් යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

   ii. ළමා නාට්‍ය සඳහා අනුශාංගික අංග භාවිත කිරීමේදී සැලකිලිමත් වියයුතු කරුණු 3 ක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

5. i. ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් ලියන්න. (ලකුණු 04)

   ii. තමන් විසින් තෝරා ගත් සත්ව චරිතයක් නිරූපණය කිරීමට ගැළපෙන රංග වස්ත්‍රයක් වර්ණ සහිතව නිර්මාණය කරන්න. (ලකුණු 06)